**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, ශුද්ධ මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු. මිලියන 331.2 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේදී ඌණතාවය රු.මිලියන 352.5 ක් ලෙස වාර්තා විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඌණතාවය රු. මිලියන 21.3 කින් හෙවත් සියයට 6 කින් අඩු වීම සඳහා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ ලැබුණු ප්‍රදානය රු.මිලියන 67.4 කින් වැඩිවීම ප්‍රධාන හේතුව විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

| | 2021 | 2022 | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු. | % |
| **<u>කොමිෂන් සභාවේ ආදායම</u>** | | | |
| පොලී ආදායම | 1,820,617 | 717,743 | (60.5) |
| රජයේ ප්‍රදාන (මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය) | 104,804,128 | 172,252,739 | 64.3 |
| **<u>කොමිෂන් සභාවේ වියදම්</u>** | | | |
| කාර්යය මණ්ඩල වැටුප් | 148,721,963 | 160,983,569 | 8.2 |
| සේවක සුබසාධන හා වෙනත් සේවක වියදම් | 30,933,949 | 37,965,470 | 22.7 |
| සේවක වාහන දීමනා | 26,662,653 | 25,881,000 | (2.9) |
| සේවක වෛද්‍ය වියදම් හා රක්ෂණය | 15,350,619 | 16,113,521 | 4.9 |
| විදේශීය පුහුණුව සහ සංචාර | 0 | 7,081,485 | 100 |
| කුලී සහ කාර් පාක් කුලී | 101,143,670 | 110,895,458 | 9.6 |
| ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන වියදම් - එකතුව | 55,241,934 | 50,328,063 | (8.9) |
| • ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය | 14,862,714 | 19,050,659 | 28.1 |
| • මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 24,840,257 | 10,278,137 | (58.6) |
| • අධ්‍යාපන වැඩසටහන් | 1,802,431 | 1,678,495 | (6.8) |
| • ජාත්‍යන්තර සාමාජිකත්ව ගාස්තු - අයි.ඕ.එස්.සී.ඕ | 4,210,388 | 7,334,807 | 74.2 |
| • ප්‍රසිද්ධිය සහ ප්‍රචාරණය | 146,664 | 147,015 | 0.2 |
| • වෙළඳපොල ආවේක්ෂණ පිරිවැය | 9,349,152 | 11,820,060 | 26.4 |

අ. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, ප්‍රතිඵල මූලික මූල්‍යකරණ සංරචකය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2 ක් හා ආයෝජන මූලික මූල්‍යකරණ සංරචකය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 8 ක් වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 10 ක් ලබා ගැනීමට කොමිෂන් සභාව හිමිකම් ලබයි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට, කොමිෂන් සභාවට එකතුව රු. මිලියන 369.30 (2019 දී රු. 81,124,254 ක්, 2020 දී රු. 11,720,560 ක් හා 2021 දී රු.මිලියන 104,804,128 හා 2022 දී රු. 171,674,294 ක් වශයෙන්) ක් ප්‍රතිඵල මූලික මූල්‍යකරණ සංරචකයේ කොටසක් ලෙස ලැබී තිබුණි. තවද, ආයෝජන මූලික මූල්‍යකරණ සංරචකය යටතේ දේශීය වෙළෙන්දන්ට රුපියල්වලින් ගෙවීමට ඇමෙරිකානු ඩොලර් 107,650 ක් කොමිෂන් සභාව ලබාගෙන තිබූ අතර, 2022 දෙසැම්බර් 31 වන විට විදේශීය වෙළෙන්දන්ට ඇමෙරිකානු ඩොලර් 197,303 ක් සෘජුවම ද ගෙවා තිබුණි.

ආ. ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 19.05 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු. මිලියන 14.86 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 4.19 ක හෙවත් සියයට 28 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පිරිවැය රු.මිලියන 10.27 ක් වූ අතර එය පෙර වර්ෂයේ රු.මිලියන 24.84 ක් වූයෙන් රු.මිලියන 14.57 ක හෙවත් සියයට 59 ක අඩුවීමක් සමාලෝචිත වර්ෂයේ පිළිබිඹු කරන ලදි. එසේම, සමාලෝචිත වර්ෂය සඳහා මුළු ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වියදම රු. මිලියන 50.32 ක් වූ අතර එය පෙර වර්ෂයේ රු.මිලියන 55.24 ක් වූයෙන් රු.මිලියන 4.92 ක අඩුවීමක් පිළිබිඹු කරන ලදි.

ඇ. 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 156 වගන්තිය ප්‍රකාරව, සුරැකුම්පත් වෙළඳපොළ දියුණු කිරීම, එහි කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී, කිරීමේදී සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියවා ගැනීම සහ වෙනත් එහි සඳහන් කාර්යයන් සඳහා පනත යටතේ පනවනු ලබන සෙස් බද්ද භාවිතා කිරීමට අවසරය ලබා දී තිබේ. ඒ අනුව, කොමිෂන් සභාවේ වියදම් මූල්‍යනය කිරීම සඳහා සෙස් අරමුදලින් රු. මිලියන 331.26 ක් මාරු කර තිබුණු බව නිරීක්ෂණය විය. කොමිෂන් සභාවේ මුළු වියදම රු. මිලියන 542.68 ක් වූ අතර, ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී මුළු වියදමෙන් රු.මිලියන 50.32 ක් හෙවත් සියයට 9.2 ක් වියදම් කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විමර්ශන පැවැත්වීම

**විගණන නිරීක්ෂණය**

අ 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 16(ඩ) වගන්තිය අනුව, වෙළඳපොළ ආයතනයක, වෙළඳපොළ අතරමැදියකුගේ, ලියාපදිංචි තැනැත්තකුගේ, ලැයිස්තුගත පොදු සමාගමක හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්වයක යම් කටයුත්තක් පිළිබඳව විභාග කිරීම හා විමර්ශන පැවැත්වීම කොමිෂන් සභාව කළ යුතුය. ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, විමර්ශන පැවැත්වීමේ ප්‍රගතිය පහත පරිදිය.

| විමර්ශනවල ස්වභාවය | 2022.01.01 දිනට පැවති | 2022 වර්ෂය තුළ ලැබුණු | 2023 ජූලි 21 වන විට නිම කරන ලද | 2023 ජූලි 21 වන විට නිම කිරීමට පැවති |
|---|---|---|---|---|
| ලැයිස්තුගත සමාගම්වල කොටස් අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළඳාම් කිරීම | 14 | 7 | 9 | 12 |
| ලැයිස්තුගත සමාගම්වල කොටස් මිල/වෙළඳපොළ අයුතු ලෙස හැසිරවීම | 26 | 12 | 14 | 24 |
| ලැයිස්තුගත සමාගම්වල කොටස් මිල/වෙළඳපොළ අයුතු ලෙස හැසිරවීම සහ/හෝ අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළඳාම් කිරීම | 5 | 1 | 0 | 6 |
| පෙර විකුණුම් (Front Running) | 3 | 4 | 2 | 5 |
| අත්කර ගැනීමේ හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය කඩ කිරීම | 2 | 0 | 1 | 1 |
| වෙනත් කඩකිරීම් | 1 | 1 | 0 | 2 |
| වෙනත් නියාමන ආයතන විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් සම්බන්ධයෙන් කරනු ලබන මූලික විමර්ශන | 15 | 0 | 15 | 0 |
| විශේෂ පැවරුම් / පැමිණිලි | 4 | 2 | 6 | 0 |
| **එකතුව** | **70** | **27** | **47** | **50** |

**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

- කාලානුරූපීව, විමර්ශන ක්‍රියාවලිය දැඩි කරන ලද අතර, පවතින විමර්ශන කඩිනමින් අවසන් කිරීමට කාලසීමා ලබා දෙන ලදි. පරිපූර්ණ විමර්ශන, මූලික විමර්ශන, පැමිණිලි හා වෙනත් විශේෂ විමර්ශන ඇතුළත්ව වර්ෂය ආරම්භයේදී අපේක්ෂිත විමර්ශන 70 ක් පැවතුණි. තවද, වර්ෂය තුළදී කොමිෂන් සභාව විමර්ශන 27 ක් ( සම්පූර්ණ විමර්ශන 25 ක් හා විශේෂ පැවරුම් 2 ක් ) ක් ආරම්භ කරන ලදි.
- කොමිෂන් සභාව 2023 ජූලි 21 වන විට ඉහත ඒවා අතුරින් විමර්ශන 47 ක් නිම කරන ලදි.
- ඒ අනුව, 2023 ජූලි 21 වන විට අතැති විමර්ශන 50 ක් පැවතුණි.

**නිර්දේශය**

විමර්ශනය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් කඩිනම් කිරීම අවශ්‍ය වේ.

| | | | |
|---|---|---|---|
| ආ | කොමිෂන් සභාව අනුමත කරන ලද විමර්ශන අත්පොත අනුව, පැමිණිල්ලක් හෝ යොමු කිරීමක් ලැබුණු විට විමර්ශන පරීක්ෂණයක් අවශ්‍ය ද යන්න තීරණය කිරීමට ආවේක්ෂණ හා විමර්ශන කමිටුවක් පැවතුණි. තවද, විමර්ශනයේ සොයාගැනීම් කමිටුවේ නිර්දේශ සහිතව කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 14 දින පැවැති 457 වන රැස්වීමේදී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අවේක්ෂණ/විමර්ශන නිරාකරණය කිරීමේ ක්‍රියාවලි ප්‍රවාහ සටහනට එවැනි යාන්ත්‍රණයක් ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව, යම් කාරණයක් මත පරීක්ෂණයක් අවශ්‍ය වේද යන කාරණය නොතකා විමර්ශන අංශය විසින් සියලු පැමිණිලි/ යොමුකිරීම් විමර්ශනය කළ යුතු බව නිරීක්ෂණය විය. එබැවින්, කුමන කාරණා සඳහා විමර්ශනයක් අවශ්‍යවේද යන්න තීරණය කිරීමට හා කොමිෂන් සභාවේ සමාලෝචනයට පෙර විමර්ශන සමාලෝචනය කිරීම තවදුරටත් කඩිනම් කිරීම සඳහා සුදුසු පරිදි කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සාමාජිකයන්ගෙන් සමන්විත විමර්ශන අධීක්ෂණය කිරීමේ කමිටුවක් ස්ථාපිත කිරීමට යෝජනා කරන්නෙමු. එය විමර්ශන ක්‍රියාවලියේ නියුක්ත වූ නිලධාරීන් සමඟ විමර්ශන වාර්තා සාකාච්ඡා කිරීමට හා එහි නිර්දේශ කොමිෂන් සභාවේ අවසාන අනුමැතියට ඉදිරිපත් කිරීමට උදව් විය හැකි අතර එය දැනුවත් තීරණ ගැනීමට කොමිෂන් සභාවට හැකියාව ලබා දෙයි. | විමර්ශන ක්‍රියාවලිය දැඩිකිරීමේ වැදගත්කම, පවතින විමර්ශන සංඛ්‍යාව සහ කාලානුරූපීව අවසන් කිරීම සැලකිල්ලට ගෙන කොමිෂන් සභාවේ සාමාජියන් තිදෙනෙකුගෙන් සමන්විත අධීක්ෂණ කමිටුවක්, 2023 ජූලි 14 දින පැවති කොමිෂන් සභාවේ 487 වැනි රැස්වීමේදී ගත් කොමිෂන් සභාවේ තීරණයකට අනුව ස්ථාපිත කරන ලදි. | නව කමිටුවේ අධීක්ෂණය සහිතව විමර්ශන සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ විධායක වර්ගීකරණයට අයත්, ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන අධ්‍යක්ෂක, අවේක්ෂණ අධ්‍යක්ෂක, නීති අධ්‍යක්ෂක, මානව සම්පත් හා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක, සහකාර අධ්‍යක්ෂකවරු 9 න් 3 ක්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 9 න් 5 ක්, කළමනාකරුවන් 16 න් 6 ක්, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් 22 න් 9 ක් හා සහකාර කළමනාකරුවන් 49 න් 20 ක් 2023 ජූලි 25 වන විට සැලකිය යුතු කාලයක් තිස්සේ පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. ප්‍රධාන කළමනාකරණ තනතුරු පුරප්පාඩුව පැවතීම කොමිෂන් සභාවේ ඵලදායී ක්‍රියාකාරීත්වයට බලපෑ හැකිය. | නව කොමිෂන් සභාව සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී පුරප්පාඩු පිරවීමට පියවර ගන්නා ලදි. නව පනත යටතේ ඉහළ කාර්යය සාධනයක් ලබාදීම පිණිස අදාල විශේෂිත කුසලතා හා දක්ෂතාවයන් සහිත පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීම, පාරිශ්‍රමික ගෙවීම හා අයෝජනය කිරීම අවශ්‍ය බව කොමිෂන් සභාවේ අදහස විය.<br>තවද, 2021 මාර්තු සිට ආරම්භ කරමින් ඉදිරි වර්ෂ 5 තුළදී කොමිෂන් සභාවේ කාර්යයන් කරගෙන යාමට අවශ්‍ය කරන මානව සම්පත්වල ඉහළ විශේෂිත ස්වභාවය සැලකිල්ලට ගනිමින් කාර්යය මණ්ඩලය 96 සිට 147 දක්වා වැඩිකිරීමට දුන් අනුමැතිය කොමිෂන් සභාව සැලකිල්ලට ගන්නා ලදි. කෙසේ වුවද, තනතුරු ප්‍රචාරය කළත්, නැවත ප්‍රචාරය කළත්, සුදුසු පුද්ගලයන් පත්කිරීම අපහසු වී ඇති අතර කාලය පුරා සම්මුඛ | පවතින පුරප්පාඩු තනතුරු පිරවීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | | පරීක්ෂණ කිහිප වරක් පවත්වන ලදි. ප්‍රධාන ඩිජිටල් නිලධාරී, මානව සම්පත් සහකාර අධ්‍යක්ෂක, නීති අධ්‍යක්ෂක සහ සහකාර කළමනාකරුවන් යන තනතුරු පිරවීමට සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. | |
| ආ | 2016 අප්‍රේල් 19 දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාවේ එක් නිලධාරියෙකුගේ සේවය තහනම් කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 31.11 උප වගන්තියට අනුකූල නොවන පරිදි, වාහන දීමනාව හා අනෙකුත් ප්‍රතිලාභ හැර ඔහුගේ මාසික දළ වැටුපෙන් හරි අඩකට සමාන මුදලක් ගෙවීම් කර තිබුණි. 2016 අප්‍රේල් 20 සිට 2018 අගෝස්තු 31 දක්වා කොමිෂන් සභාව විසින් ඔහු වෙනුවෙන් දරන ලද අර්ධ මාසික වැටුප් වියදම රු. 5,212,815 ක් විය. 2018 සැප්තැම්බර් 18 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (කෝප්) රැස්වීමේ නිර්දේශයට අනුව, කොමිෂන් සභාව වැටුප් ගෙවීම නැවැත්විය යුතු අතර ගෙවන ලද මුළු වැටුප අය කර ගැනීමට කටයුතු කළ යුතුය. ඒ අනුව, 2018 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අර්ධ මාසික වැටුප ගෙවීම නවතා තිබූ අතර ඉහත සඳහන් මුදල ආපසු ගෙවන ලෙස 2018 නොවැම්බර් 15 දිනැති ලිපියෙන් නිලධාරියාට දන්වන ලදී. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් 2023 ජූලි 25 දින වන විටත් එය අය කරගෙන නොතිබුණි. | කෝප් රැස්වීමේ නිර්දේශ අනුව, සේවය තහනම් කරන ලද නිලධාරියාට ගෙවන ලද අඩ වැටුප 2018 සැප්තැම්බර් සිට නැවැත්වීමට කොමිෂන් සභාව පියවර ගන්නා ලදි. තවද, කෝප් රැස්වීමේ නිර්දේශ අනුව, සේවය තහනම් කළ කාලසීමාව තුළ ගෙවන ලද අඩ වැටුප නැවත ගෙවන ලෙස එම නිලධාරියාට 2018 නොවැම්බර් 15 දිනැති ලිපියකින් දන්වන ලදි. ඔහු 2018 නොවැම්බර් 15 දිනැති ලිපියට ප්‍රතිචාර නොදැක්වූ බැවින් 2019 අගෝස්තු 26 දින තවත් සිහිකැඳවීමක් යවන ලද අතර එය 2019 අගෝස්තු 27 දින ඔහු විසින් පිළිගන්නා ලදි. කෙසේ වෙතත්, අද දක්වා මුදල් තැන්පත් කර නොතිබුණි. තවද, සේවය තහනම් වූ නිලධාරියා සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයට අදාලව කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද අභ්‍යන්තර පරීක්ෂණය තවමත් විනිශ්චය සභාව හමුවේ පවතී. | ආයතන සංග්‍රහයේ 31.11 උප වගන්තියට අනුකූල නොවන පරිදි ගෙවූ මුදල අයකර ගැනීම අවශ්‍ය වේ. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පහත අයිතම්වල අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන්, එම අවස්ථාවලදී අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | **මහජනතාව දැනුවත් කිරීමේ වියදම්**<br><br>මෙය අඩුවීම ප්‍රධාන වශයෙන්ම රටෙහි පැවති ආර්ථික හා දේශපාලන අස්ථාවර තත්වය නිසා වූ අතර එය එවැනි වැඩසටහන්වල ප්‍රගතියට බාධා කරන ලදි. සැළසුම් කරන ලද සමහර මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ මාර්ගගත ක්‍රමය හරහා පවත්වන ලද අතර එමඟින් පිරිවැය | විචලනයන් අවම කර ගැනීම අවශ්‍ය වේ. |

| අයිතමය | 2022 වර්ෂය සඳහා අයවැයගත | 2022 වර්ෂය සඳහා සත්‍ය වියදම | විචලනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු | % |
| මහ ජනතාව දැනුවත් කිරීම | 64,750,000 | 10,278,137 | 84 |
| ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය | 38,000,000 | 19,050,659 | 50 |
| සම්මන්ත්‍රණ ගාස්තු | 3,241,000 | 1,678,495 | 48 |
| විදේශීය පුහුණුව සහ සමුළු | 25,000,000 | 7,081,485 | 72 |
| සාමාජික ගාස්තු, අනුග්‍රහ දැක්වීම් හා දේශීය පුහුණුව | 8,450,000 | 3,363,804 | 60 |
| ඊඩීපී හා උපකරණ ගාස්තු | 30,382,698 | 21,744,149 | 28 |

සැලකිය යුතු ලෙස අඩුවන ලදි.

**ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වියදම**

සමාලෝචිත කාලපරිච්ඡේය තුළදී අදාල පාර්ශව ඉල්ලීම් නොකිරීම නිසා, යෝජිත තැරැව්කාර පසු කාර්යාල පද්ධතිය මත පිරිවැය නොදැරීම හේතුවෙන් සත්‍ය ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වියදම සැලකිය යුතු ලෙස අඩුවිය.

**සම්මන්ත්‍රණ ගාස්තු**

ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳව අධ්‍යනය කිරීමට උනන්දුවක් දක්වන ශිෂ්‍යයන්ට ඉගෙන ගැනීමේ අවස්ථාව ප්‍රාග්ධන වෙළඳපොළ ඉගෙනීමේ වේදිකාව මඟින් සපයන ලදි. සමාලෝචිත වර්ෂය තුළදී, රටෙහි පැවති ආර්ථික තත්වය හේතුවෙන් වැඩසටහන් පැවත්වීමට නොහැකි විය.

**විදේශ පුහුණුව, සමුළු, සාමාජික ගාස්තු, අනුග්‍රහ දැක්වීම් සහ දේශීය පුහුණුව**

ප්‍රධාන වශයෙන්ම, විදේශ සංචාර මත රේඛීය අමාත්‍යාංශය පනවන ලද සීමාකිරීම් විදේශ පුහුණුව මත අඩු වියදම සඳහා හේතුව විය. ඊට අමතරව, බොහෝ සාමාන්‍ය විදේශ පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ විවිධ හේතු මත නොපවත්වන ලදි. කෙසේ වෙතත්, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ අදාල වැඩ ක්ෂේත්‍ර සම්බන්ධව නව දැනුම ලබා ගැනීමට මාර්ගගත සැසි කිහිපයකට සහභාගි වූ අතර, වර්ෂය තුළදී සමහර කාර්යය මණ්ඩල සාමාජිකයන් අනුග්‍රහ දක්වන අධ්‍යන පහසුකම් ලබා ගන්නා ලදි.

**ඉලෙක්ට්‍රොනික දත්ත පෙරසැරිකිරීම සහ උපකරණ නඩත්තුව**

සැපයුම්කරුවන් කිහිප දෙනෙකු සමඟ අයවැයගත පිරිවැයට වඩා අඩුවට නඩත්තු ගිවිසුම්වලට එළඹීමට කොමිෂන් සභාවට හැකිවූ නිසා සත්‍ය පිරිවැය අයවැයගත ප්‍රමාණයට වඩා අඩුවිය.